කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **07** MSW/26/11/02/01
වර්ණය : රතු

තද සුළං සහ මුහුදු රළුවීම පිළිබඳ අනතුරු ඇඟවීමේ නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
ඉදිරි පැය **24** සඳහා වලංගු වන පරිදි, **2026** නොවැම්බර් මස **02** දින පෙ.ව.**10.30** ට නිකුත් කරන ලදී.

බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශයේ යාත්‍රාකරන බහුදින ධීවර යාත්‍රා සඳහා සහ මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන්වන ගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා.

ක්‍රියාත්මක වන්න!


බටහිර-මධ්‍යම සහ ඊට යාබද නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින "මුරාසු" (Murasu) සුළි කුණාටුව, ප්‍රබල සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී ඇත. 2026 නොවැම්බර් 02 වැනි දින උදෑසන 05.30 වන විට, මෙම පද්ධතිය උතුරු අක්ෂාංශ 13.9° සහ නැගෙනහිර දේශාංශ 81.8° ආසන්නයේ කේන්ද්‍රගතව පැවතුණි.

මෙම "මුරාසු" ප්‍රබල සුළි කුණාටුව වයඹ දෙසට ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු වන අතර, නොවැම්බර් මස **02** දින මධ්‍යම රාත්‍රිය සහ **03** දින අළුයම් කාලය පමණ වන විට ආන්ද්‍රා ප්‍රදේශ් වෙරළ හරහා ඉන්දියානු ගොඩබිම වෙත ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පහත සිතියමේ **"Warning"** කාණ්ඩයට අයත් මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැයට කිලෝමීටර **(70-80)** දක්වා වැඩි විය හැකි අතර, ගිගුරුම් සහිත තද වැසි ඇති විය හැකි බැවින් මෙම මුහුදු ප්‍රදේශ ඉතා රළු විය හැක.

එමනිසා උතුරු අක්ෂාංශ **10** ත් **17** ත් සහ නැගෙනහිර දේශාංශ **80** ත් **90** ත් අතර මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වළකින ලෙසත් එම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතු වල යෙදෙන ප්‍රජාවන් ආරක්ෂිත ප්‍රදේශ කරා යාත්‍රා කරන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.

මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා ගැඹුරු මුහුදු ප්‍රදේශවලත් නැවත දැනුම් දෙනතුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැලකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.



මෙම මුහුදු ප්‍රදේශවල කටයුතුකරන ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිළිබඳව අවධානයෙන් පසුවන ලෙසත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඉදිරි නිවේදන සහ අනාවැකි සම්බන්ධයෙන් විමසිලිමත් වන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.


කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

පුරෝකථනය කරන ලද ස්ථාන සහ තීව්‍රතා:

දිනය	වේලාව	ස්ථානය (උතුරු අක්ෂාංශ/ නැගෙනහිර දේශාංශ)	කැළඹිලි ස්වභාවය
2026-11-02	පෙ. ව. 05.30	13.9/81.8	ප්‍රබල සුළි කුණාටුවක්
2026-11-02	පෙ. ව. 11.30	14.2/81.1	ප්‍රබල සුළි කුණාටුවක්
2026-11-02	ප. ව. 05.30	14.6/80.6	ප්‍රබල සුළි කුණාටුවක්
2026-11-02	ප. ව. 11.30	15.1/80.1	ප්‍රබල සුළි කුණාටුවක්
2026-11-03	පෙ. ව. 05.30	15.5/79.8	සුළි කුණාටුවක්
2026-11-03	ප. ව. 05.30	16.0/79.5	ගැඹුරු පීඩන අවපාතයක්
2026-11-04	පෙ. ව. 05.30	16.5/79.2	පීඩන අවපාතයක්

නිරීක්ෂණය කළ සහ පුරෝකථනය කළ ගමන් මාර්ගය:



Source : https://rsmcnewdelhi.imd.gov.in/